ලංකාවේ දේශපාලන අනාගතය කොයිබටද?



පක්ෂ දේශපාලනය

ගතානුගතික ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අසමත් රාජ්‍යයක් බව ඔප්පු වෙමින් පැවතුණි.එහි කූට ප්‍රාප්තිය ලඟා වුයේ ගෝටාබයගේ කාලයේදීය.දේශපාලන පක්ෂ හා මතවාදයන්ට බෙදී ගිය හා ජාති අනුව,ආගම් අනුව කුල හා ගෝත්‍ර වශයෙන් බෙදී ගිය ශ්‍රී ලංකාව එය කළමනාකරණය කරගත්තේම නැත.අද වන විට ශ්‍රී ලංකාව දේශපාලනික වශයෙන් ,සංස්කෘතික හා සමාජීය මෙන්ම ආර්ථික වශයෙන් ද ලෝකයේ රටවල් අතර අන්තිම දහදෙනා අතරය.මේ කරුණ හා එයට රට පත්වීමට හේතුව කිසිවිටක ලංකාවේ පවතින දේශපාලන පක්ෂ වල වියතුන් පවා විමර්ශනශිලිව ජනතාවට ලබා දෙන්නේ නැත.ජනතාවට පක්ෂ දේශපාලනයේ දුර්වලතා හා ඒවා සකසා ගන්නා ආකාරය ගැන දේශපාලන පක්ෂ සියල්ලම කියන්නේ මුසාවන්ය.ලංකාව තම දේශීය ඛනිජ නිධි හෝ කෘෂිකර්මය මගින් මේ පවතින තත්ත්වයෙන් ගොඩ ගත හැකි රටක් නොවේ.එය ඉතා සියුම්ව වෙනස් කළ යුතු ගොඩ ගත යුතු රටකි.මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ පක්ෂ තේරුම් ගෙන නොසිටින බව පැහැදිලිය.ඔවුන් ලහි ලහියේ මැතිවරණයක් ඉල්ලා සිටිති.විකල්ප යයි කියන පිළිගත් දේශපාලන පක්ෂයක් පවා නැති පුද්ගලයන් පවා චන්දයකට යාමට බල කරති.එහි උපක්‍රමය ඔවුනට රාජ්‍ය බලය ලබා ගැනීම නොවන බව ඕනෑම කරුණු තේරුම්ගත හැකි පුද්ගලයකු ට වැටහේ.එසේ චන්දයකට යන්නට බල කරන පක්ෂ අතර ජවිපය ප්‍රධානය,පෙරටුගාමීන් හා පැතුම් කර්නර් සංසදය සජිත් පිලටත් වඩා ඉදිරියෙන් සිටි.පාටලී චම්පික දැන් ඒ හඬ අඩු කරමින් වෙනදේ බලාගෙන සිටි.කෙසේ වුවත් මේ කුඩා පක්ෂ වල උනන්දුව තමන්ට ඇති ආසන සංඛ්‍යාව වැඩිකරගැනීම මිස දේශපාලන බලය ඇල්ලීම නොවේ.මේ නිසා මේ සියළු පක්ෂවල අරමුණ ජනතාව නොවන බව ජනතාව වටහා ගන්නේ නම් අළුත් බලවේගයක් බිහිවීම නුදුරු වසර පහක් තුළ අනුමාන කළ හැකිය.එසේ නොවුණහොත් ලංකාව රට හැර යන අධික ශ්‍රමික සංඛ්‍යාව රටට එවන මුදලින් නැගිටිමින් සිටීම හා ඒ හරහා ලබන සුළු ආර්ථික වර්ධනය ට තව වසර පහක් තුළ ලඟා වනු ඇත.එය නිරසාර,ක්‍රමයේ වෙනසක් නොව පවතින ක්‍රමය යටතේ නැවත ඕනෑම මොහොතක කඩා වැටිය හැකි තත්ත්වයකි.එයින් සමාජීය හා සංස්කෘතික මෙන්ම ප්‍රමාණික කඩා වැටීම අවසන් නොවනු ඇත.

ජනවාර්ගික තත්ත්වයන්

ශ්‍රී ලංකාව බහුවිධ ජනවර්ග ජීවත්වන ඉතිහාසය පුරාම සංක්‍රමණික රටකි.පවතින ආර්ථික ගැටළු හමුවේ තරුණ පරපුර සීග්‍රයෙන් තම මව්බිම හැර යමින් සිටිති.ඒ තරුණ පරපුර තම දරුවන්,බිරින්දෑවරුන් ද හැකි ඉක්මනින් එතරට ගෙන්වා ගන්නේ ලාංකීය දරුවන්ට ලංකාව තුළ අනාගතයක් නොවන බැවිනි.මේ හැර යන්නේ පරම්පරා තුනකි.පරම්පරා තුනක බුද්ධි ගලනයක් පළමුව සිදුවුයේ 1983 කළු ජූලියෙන් පසුවය.මේ සිදුවන නිහඬ බුද්ධි ගලනය 1983 බුද්ධි ගලනයට වඩා සීග්‍ර හා අනතුරුදායක එකකි.දශක තුනක යුද්ධය නිසා දමිල ජනවර්ගයට අයත් බුද්ධි ගලනයක් සිදුවෙමින් පැවතුනි.එහෙත් එය මෙවර සිදුවන බුද්ධිගලනයට වඩා ප්‍රමාණිකව විශාලය.පැයකට 32-50 ත් අතර රට හැර යන ජාතියක හෝ ජනවර්ගයක පැවැත්ම අවිනිශ්චිතය .සමහරවිටක මේ සියළු අර්බුධ වල නිමැවුම් කරුවන්වන භූ දේශපාලනයට අවශය වුයේත් ශ්‍රී ලංකාව ජනශූන්‍ය හෝ ජනවර්ග සංයුතියෙන් වෙනස් රටක් බවට පත් කිරීම විය හැකිය.මේ බව ශ්‍රී ලංකාවේ වියතුන් තේරුම් ගනිමින් සිටින බව පැහැදිලි නොවේ.ආර්ථිකය ජයගැනීම හා විනාශකාරී ආර්ථික ප්‍රතිපත්ති වලට මුදල් සැපයීම ජනතාව කෙසේ හෝ ඉටුකරනු ඇතැයි යන්න ඔවුන්ගේ වගකීම විය යුතුය.

ආගමිකත්වය ප්‍රතික්ෂේපවීම.

කාලයක සිට වික්ටර් අයිවන් වැනි විචාරකයන් ලංකාවේ බර්ගර් වරුන් එලවා ගැනීම මාතෘකාවක් කරගෙන තිබුණි.පාස්කු ප්‍රහාරය පවා මාතෘකාවක් නොකරගත් රන්ජන් රාමනායක පන්සල් හා රුවන්වැලිසෑය හේතු සහිතව වුවත් උපක්‍රමශිලීව ඉලක්ක කරගෙන තිබුණි.පාස්කු ප්‍රහාරයට බෞද්ධයන්  යුක්තිය ඉල්ලන විට කාදිනල්  මැල්කම් රන්ජිත් හා ඔහුගේ හිතවතුන් ලංකාව පුරා කතෝලික ප්‍රජාව උත්කර්ෂයට නැංවීමට උපක්‍රමශිලීව යොදාගනු ලැබිණි.අරගල භූමිය පුරාම රතු කඳවුරේ භික්ෂුන් බෞඩ්දත්වයට එරෙහිව හැසිරෙන්නට විය.නිරාගමික යයි කියාගන්නා කතෝලික සමාජවාදීන් සමාජ මාධ්‍ය  තුළ බෞද්ධ ආගමික උත්සව වන චීවර පුජාවන් දැඩි අවමනට ලක්කරමින් සිටිති.පැහැදිලිම සත්‍යය,ගෝඨාබය අති  බෞද්ධවීම හා බෞද්ධ උපදේශන සභා බිහිකිරීම  පවා මේ සැලසුමේ කොටසක් බවය.ඒ සැලසුමට අනුව ශ්‍රී ලංකාව අබෞද්ධ රටක් කිරීමේ සමාජ සැලසුමකට එහා ගිය සැළසුමක් පවතී.මේ සැළසුම ද භූ දේශපාලන සැලසුමක් වුවද එය ක්‍රියාත්මක වන්නේ පවතින කරුණු පාදක කරගෙනය.සින්දු අගාම හෝ කතෝලික ක්‍රිස්තියානි ආගම් හෝ නිකායන් අවමානයට ලක් නොවේ.ක්‍රිකට් තරඟාවලියක ජය සාක්කුවට දමා ගැනීමට උත්සුක වන ආගමිකත්වය සැලසුම් කරන්නේ ශ්‍රී ලංකාවේ ජනමනස සම්පූර්ණයෙන්ම බෞද්ධත්වයෙන් ඉවත් කිරීමටය.මේ සැළසුම හොඳින් ක්‍රියාත්මක වන අතර ඉදිරියේදී සිංහල-බෞද්ධ යන සංකල්පය උසුළු විසුළු වලට පමණක් අදාළ වන මාතෘකාවක් වනු ඇත.රට හැර යන ජනවර්ග අනුව සිංහල -බෞද්ධ සංකල්පය අනාගතයේදී ඉතා සුළු තේමාවක් වීමට නියමිතය.

නීතියේ ආධිපත්‍යය.

21 වන සංශෝධනය යම්තාක් දුරකට සාධනීය බලතල සිමා කිරීම් හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය ස්වාධින කිරීමට උත්සාහ කිරීමකි.එය කෙතරම් කාලයක් ක්‍රියාත්මක වේදැයි අධීක්ෂණය කළ යුතුය.නීතීපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් නෛතික ආයතන වල ව්‍යුහාත්මක සම්පූර්න වෙනසක් අවශ්‍ය බව කාලයක

සිට පවතින අවශ්‍යතාවයකි.අන්තර්ජාතිකව මානව හිමිකම් හා ඒ ආශ්‍රිත සියළු චෝදනා ගොනුව ඇත්තේ අධිකරණයේ ක්‍රියාමාර්ගය අනුවය.අධිකරණය හා යුක්තිය පසිඳලීම ජාත්‍යන්තරය ලංකාවේ දකින විශාලතම ගැටළුව බව ලංකාවේ බලධාරීන් තේරුම් ගන්නේ නැත.ලංකාවේ අධිකරණය මෙතෙක් එය තේරුම් ගෙන නැත .දැන්වත් එය තේරුම්ගත යුතුය.එසේ නොවීම ලංකාවේ වසර 74 ක අවිනිශ්චිත අතීතයට වඩා අවිනිශ්චිත අනාගතයක් හිමිකර දෙනු ඇත.නීතියේ ආධිපත්‍යය හා නිලධාරී වාදය ලංකාව මේ මොහොතේ පිඩා විදින විශාලතම ගැටළුවයි.ඒවා විසදෙන අයුරක් නැත.රාජ්‍ය සේවය යනු ජන ජීවිතය අත්අඩංගුවට ගැනීමට ඇති හේතුන් බව හා බලය බව ඉදිරියේදීත් විසදෙන්නේ නැත.

මේ කරුණු  අනුව  ශ්‍රී ලංකාවේ අනාගතය සුබ එකක් වීමට ඇති අවස්ථාව සීමිතය.ලංකාව නව්‍යලෙස දකින්නට .නව්‍ය  ලෙස ගොඩ නගන්නට නම් සම්පුර්න චින්තන විප්ලවයක් වෙත අවකාශය සුදානම් විය යුතුය.එසේ නොවී චරිත මාරුකිරීමෙන් නම් එය එසේ වේ යයි සිතන්නට නොහැකිය.

ගැමුණු ශ්‍රාවස්තිබණ්ඩාර විසිනි.